# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1773/1 - 2012 අගෝස්තු මස 27 වැනි සඳුදා - 2012.08.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්.ඩී.බී. 104/44.

**(87 වන අධිකාරය) භාර ආඥාපනත**

114 වැනි වගන්තිය යටතේ නියමය

"ඔක්ෂෝනියන් හාට් ෆවුන්ඩේෂන් " යන භාරයේ භාරකරුවන් එනම් -

1. රවි පෙරුමාල්පිල්ලෙයි මහතා,
2. වෛද්‍ය නයෝමලී අමරසේන,
3. ආනන්ද අතුකෝරාල මහතා,
4. ජගත් ප්‍රනාන්දු මහතා,
5. ෆයිස් මොහිඩීන් මහතා,
6. වෛද්‍ය ස්කන්ත රන්ජින් රාජියා,
7. සිංහ රත්නතුංග මහතා,
8. සෙල්ලයියා පොන්නුසාමි මහතා,

විසින්, (87 වැනි අධිකාරය වූ) භාර ආඥාපනතේ 114 වගන්තිය යටතේ සංස්ථාගත කරනු ලැබීම සඳහා අධිකරණ අමාත්‍යවරයා වෙත ඉල්ලුම්කර ඇති හෙයින් -

ඉහත කී වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධිකරණ අමාත්‍ය රවුෆ් හකීම් වන මම, එකී භාරකරුවන් සංස්ථාපිත කිරීමට මේ නියමයෙන් බලය දෙන අතර,:

(අ) එකී භාරයේ රීති යටතේ කොළඹ, ප්‍රසිද්ධ නොතාරිස්, කන්දයියා නීලකන්ඩන් විසින් සහතික කරන ලද 2012 අප්‍රේල් මස 2 වැනි දිනැති, අංක 2052 දරන භාර ප්‍රකාශනය යටතේ යථා පරිදි පත් කරන ලද භාරකරුවන් සහ ඔවුන්ගේ තත්කාලීන අනුප්‍රාප්තිකයන් "ඔක්ෂෝනියන් හාට් ෆවුන්ඩේෂන්" යන නාමය සහ අභිධානය යටතේ, අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු යැයි ද,

(ආ) එකී භාරයේ භාරකරුවන් විසින්, එකී නාමයෙන් සහ අභිධානය යටතේ කවර හෝ විස්තරයකට අයත් යම් චංචල හෝ නිශ්චල දේපළ, එකී භාරය වෙනුවෙන් මිලදී ගැනීම, භාර ගැනීම, දැරීම, ණයට ගැනීම හෝ අන්‍යාකාරයකින් අත්කර ගැනීම, විකිණීම, හුවමාරු කිරීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, බදු දීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම කළ හැකි යැයි ද ; සහ


1A - G 16501— 385 (2012/8)

*සැ. යු.*- අති විශේෂ ගැසට් අංක 1772/1 කාණ්ඩය අංක 1772/38න් අවසන් වේ.

(ඇ) එකී භාරයට අදාළව පැන නගින සියලු නඩු නිමිතිවල දී සහ නඩුවල දී ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත කවර වූ හෝ අධිකරණයක දී එකී නාමයෙන් සහ අභිධානයෙන් එකී භාරකරුවන් විසින් නඩු පැවරීමට සහ පවරනු ලැබීමට ද, උත්තර දීමට සහ උත්තර දෙනු ලැබීමට ද, විත්තිවාචක ඉදිරිපත් කිරීමට සහ විත්තිවාචක ඉදිරිපත් කරනු ලැබීමට ද නීතියෙහි ලා හැකියාව හා බලය ඇත්තේ යැයි ද,

විධාන කර ප්‍රකාශ කරමි.

මේ නියමය ප්‍රත්‍යාදිෂ්ට කිරීම, නැතහොත් අවශ්‍ය යැයි මට පෙනී යන ආකාරයකින් එය කලින් කල වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීම, මා විසින් කරනු ලැබිය හැකි ය.

රවුෆ් හකීම්,
අධිකරණ අමාත්‍ය.

2012 අගෝස්තු මස 17 වැනි දින,
කොළඹ දී ය.

09 - 254

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.